# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 946/8 - 1996 ඔක්තෝබර් 23 වැනි බදාදා - 1996.10.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල් ඩී -බී. 21/78 IV.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1995 අංක 1 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය.,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය, 1996 අංක 13 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/11 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි 10 වන ඡේදයේ

(i) (1) වන අනුඡේදයේ (උ), (ඌ), (එ), (ඒ) සහ (ඔ) අකුරු අනුඡේද වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අකුරු අනුඡේද ආදේශ කිරීමෙන් :-

(උ) පරිසර විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
(ඌ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;
(එ) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය භාර ජාතික ආයතනයේ විධායක ප්‍රධානයා ;
(ඒ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;
(ඔ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;

(ii) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ (ක) සහ (ග) අකුරු අනුඡේද පිළිවෙලින් (ග) සහ (ච) යනුවෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(iii) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ (ඕ) අතුරු අනුඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අතුරු අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ක) කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ පිළිගත් වැවිලි පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂවරුන් අතුරෙන් පත් කරන ලද අධ්‍යක්ෂවරයෙක්

මෙම අතුරු අනුඡේදයේ කාර්ය සඳහා "පිළිගත්" යන්නෙන් ආයතනයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද බව අදහස් වේ.

(ආ) එහි 11 වන ඡේදයේ (6) වන අනුඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(6) මණ්ඩලයේ එක් එක් රැස්වීමට පැමිණෙන කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයකුට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරන ගාස්තුවක් ගෙවනු ලැබිය හැකිය."

(ඇ) එහි 12 වන ඡේදයේ

(i) (2) වන අනුඡේදයේ "පර්යේෂණ" යන වචනයට ඉක්බිතිව "දුරේක්ෂණය" යන වචනය ඇතුළත් කිරීමෙන් ; සහ

(ii) එම ඡේදයේ (3) වන අනුඡේදයේ (ජ) අතුරු අනුඡේදයේ "ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු යම් සංඛ්‍යාවක්" යන වචන වෙනුවට "සම්බන්ධීකරණ කමිටු ද ඇතුළුව ස්ථාවර කමිටු සහ තත්කාර්ය කමිටු" යන වචන ආදේශ කිරීමෙන්.

(ඈ) එහි 13 වන ඡේදයේ ලැයිස්තුගත කර තිබෙන විශේෂඥතා ලැයිස්තුව වෙනුවට, කෘෂිකර්මය පිළිබඳ මෙහි පහත දැක්වෙන විශේෂඥතා ආදේශ කිරීමෙන් :-

(අ) කෘෂිකර්ම ජීව විද්‍යාව ;
(ආ) කෘෂිකර්ම ආර්ථික විද්‍යාව ;
(ඇ) කෘෂිකර්ම ව්‍යාප්තිය ;
(ඈ) කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව ;
(ඉ) පශු විද්‍යාව ;
(ඊ) භෝග විද්‍යාව ;
(උ) ආහාර විද්‍යාව හා තාක්ෂණය ;
(ඌ) පාංශු විද්‍යාව ;
(එ) ජීවමිතිය ; සහ
(ඒ) ශාක ආරක්ෂණය.

(ඉ) එහි 14 වන ඡේදයේ

(i) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ (ආ) අතුරු අනුඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන අතුරු අනුඡේදය ආදේශ කිරීමෙන් :-

(ආ) කෘෂිකර්ම පීඨය විසින් කෘෂිකර්මය පිළිබඳ අදාළ විශේෂ ක්ෂේත්‍රයේ ආචාර්යවරුන් අතුරෙන් නම් කරන ලද එම විශේෂඥ ක්ෂේත්‍රයේ මහාචාර්යවරයකු සහ තවත් ආචාර්යවරුන් සිව්දෙනෙක්. මේ අතුරු අනුඡේදයේ 'මහාචාර්යවරයා' යන්නෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරයක් හෝ මහාචාර්ය ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ.

(ii) ඒ ඡේදයේ (7) වන අනුඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

(8) ඒ ඒ අධ්‍යයන මණ්ඩලයේ ලේකම්වරයාට, ලේකම්වරයා වශයෙන් ඔහුගේ සේවය සඳහා, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(9) අධ්‍යයන මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට, අධ්‍යයන මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන්, කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(ඊ) 5 වන ඡේදයේ (1) වන අනුඡේදයේ "ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ, හා විභාග" යන වචන වෙනුවට "ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ, දුරේක්ෂණය හා විභාග" යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) 25 වන ඡේදයේ "කෘෂිකර්මයෙහි විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙහි අර්ථකථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්

කෘෂිකර්මයෙහි විශේෂ ක්ෂේත්‍රය" යන්නෙන් කෘෂිකර්ම ජීවවිද්‍යාව, කෘෂිකර්ම ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම ව්‍යාප්තිය, කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව, පශු විද්‍යාව, ආහාර විද්‍යාව හා තාක්ෂණය, පාංශු විද්‍යාව, ජීවමිතිය, ශාක ආරක්ෂණය හෝ විශ්වවිද්‍යාලයේ හෝ ආයතනයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් විශේෂ ක්ෂේත්‍රයක් අදහස් වේ ; සහ "



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.